SEDR
Supporting Effective Dispute Resolution
ඵලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම
பயனுறுதிமிக்கவகையில் பிணக்கை தீர்ப்பதற்கு ஆதரவளித்தல்

# Supporting Effective Dispute Resolution

## Your document title

<u>ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය:</u>

*"සාධාරණ විකල්පයක් ශක්තිමත් කිරීම - SEDR වෙතින් පාඩම් සහ ගැඹුරු දැනුම"*

### 1. සැසිවාරයේ මාතෘකාව

පාට්නර් කැෆේ: *සාධාරණ විකල්පයක් ශක්තිමත් කිරීම සඳහා වූ ජාලකරණය හා ඒ සම්බන්ධ ක්‍රියාවන්වල නිරත වීම*

### 2. දිනය, වේලාව සහ ස්ථානය

2025 අප්‍රේල් 29 – පාට්නර් කැෆේ
16:30 – 17:30
ස්ථානය: අයිවි කාමරය, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය

### 3. සංකල්පයේ සාරාංශය / හැඳින්වීම

තේමාත්මක සැසිවාර හයක් (6) ලෙස සංවිධානය කර ඇති මෙම ශ්‍රාශ්ත්‍රීය සම්මන්ත්‍රණය මඟින් SEDR ක්‍රියාකාරකම්වලට සහභාගී වූ සහ එම ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලැබූ අයගෙන් සිත්ගන්නා ඉදිරිපත් කිරීම් රාශියක් ඉදිරිපත් කෙරේ. ආසන්න වශයෙන් සහභාගීවන්නන් 200 ක පමණ ප්‍රේක්ෂක සංඛ්‍යාවකින් යුත් තේමාත්මක සැසිවාරවල පූර්ණ සහභාගීත්වයේ ස්වභාවය, විශේෂඥයින් සහ වැඩසටහන් ක්‍රියාත්මක කරන හවුල්කරුවන් සමඟ සහ ඔවුන් අතර ඵලදායී ලෙස සම්බන්ධ වී, ක්‍රියාකාරකම්වල නිරත වීමට ඇති අවස්ථාවට සීමා කරනු ඇත.

Part of the programme
STRIDE — Strengthening Transformation, Reconciliation and Inclusive Democratic Engagement
Funded by the European Union
Implemented by
BRITISH COUNCIL
The Asia Foundation

මෙම පාට්නර් කැෆේ සැසිවාරය SEDR හි එක් එක් ප්‍රධාන හවුල්කරුවන් සඳහා වෙන වෙනම කුටි/මේස සකස් කරමින් (කුඩා, ඉතාමත් සමීප පරතරයක් සහිතව) සංවිධානය කරනු ලබන අතර, සහභාගිවන්නන්ට හවුල්කරුවන් සඳහා වූ කුටිවල නිදහසේ සැරිසැරීමට සහ විවේකීව කාලය ගත කිරීම පිණිස පැය 1 ක කාලයක් ලැබෙනු ඇත. හවුල්කරු ආයතනයේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ SEDR අරමුදල් සපයන ක්‍රියාකාරකම් සහ සමාජ ඒකාබද්ධතා අංශයේ ඔවුන්ගේ අනෙකුත් කාර්යයන් පිළිබඳව සහභාගිවන්නන්ට ඇති ප්‍රශ්න විමසීමට ද ඔවුන්ගේ අදහස් ලබා ගැනීමට ද සූදානම්ව සිටිනු ඇත. අනෙක් පැත්තෙන් මෙය, SEDR හවුල්කරුවන්ට ඔවුන්ගේ ජයග්‍රහණ සහ අත්දැකීම් පිළිබඳව තනි තනිව වැඩසටහනට සහභාගිවන්නන්ට වඩාත් විස්තරාත්මකව කතා කිරීමට මෙන්ම සමාන අදහස් ඇති ක්‍රියාකරුවන් සමඟ ජාලගත වීමට සහ සම්බන්ධ වීමට අවස්ථාවක් වනු ඇත. මෙම සැසිවාරය හවුල්කරුවන්ට සහ සහභාගිවන්නන්ට විවිධ ප්‍රේක්ෂක පිරිසක් අතර ඔවුන්ගේ සම්බන්ධතා ගොඩනඟා පුළුල් කිරීමට උපකාරී වන ජාලකරණය කිරීමේ වැඩසටහනක් ද වනු ඇත.

## 4. සැසිවාරයේ පරමාර්ථ

- SEDR හවුල්කරුවන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ADR මූලපිරීම් පිළිබඳ සහභාගිවන්නන්ගේ දැනුම සහ අවබෝධය ගැඹුරු කිරීම.
- SEDR හවුල්කරුවන්ට ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ උනන්දුවක් දක්වන සහභාගිවන්නන්ගේ ප්‍රශ්න සහ අදහස් වලට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් ලබා දීම.
- ශ්‍රී ලංකාවේ සමාජ ඒකාබද්ධතා අංශයේ විවිධ ප්‍රේක්ෂක පිරිසක් අතර නව ජාල ගොඩනඟා ගැනීම සහ නව සහයෝගීතා අවස්ථා ගවේෂණය කිරීම මෙන්ම ඒ සමඟම ක්‍රියාකරුවන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් අතර පවතින හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම.

## 5. මධ්‍යස්ථකරු / පහසුකම් සපයන්නා

මධ්‍යස්ථකරු: ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ වැඩසටහන් අධ්‍යක්ෂක

## 6. කථිකයන් / විශේෂඥ කණ්ඩායමේ සාමාජිකයන් / ඉදිරිපත් කරන්නන්

සහභාගිවන්නන් විසින් නැරඹූ හවුල්කරුවන්ගේ කුටි සමඟ සමගාමීව පවත්වනු ලබන සැසිවාරය.

- මුස්ලිම් එයිඩ් ශ්‍රී ලංකා (MASL)
- ක්‍රිසලිස්
- නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA)
- ඌව ශක්ති පදනම (USF)
- සර්ච් ෆෝර් කොමන් ග්‍රවුන්ඩ් (SfCG)
- ග්‍රාමීය කළමනාකරණය සඳහා ආයතනවල එකතුව (FIRM)
- ආසියා පදනම (TAF)
- යාපනය සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය (JSAC)